

# චිත්‍ර කලාව
## 09 ශ්‍රේණිය

# සඳකඩපහන නිර්මාණය
# අගයමු

| | | | |
|---|---|---|---|
| නිපුණතාව | 7.0 | : | දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලාවන් හා අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි. |
| නිපුණතා මට්ටම | 7.1. | : | ඓතිහාසික ගෘහ නිර්මාණ ආශ්‍රිත කලා අංග අධ්‍යයනය කරයි. |
| ක්‍රියාකාරකම | 7.1.1 | : | ''සඳකඩ පහණ නිර්මාණය අගයමු.'' |

පැරණි විහාර දොරටුවක අංගයක් වන සඳකඩපහණ පසුකාලීනව රජමාලිගා වැනි ප්‍රභූ ගොඩනැගිලි ආශ්‍රිතවද දක්නට ලැබේ. විහාරයකට ඇතුලූ වීමේදී පළමුව පයගැටෙන කැටයම් සහිත වූ අර්ධ කවාකාර ගල් පඩිය සඳකඩපහණ ලෙස හදුනාගැනේ. සශ්‍රීකත්වය සහ අභිවෘද්ධිය පිළිබඳ විශ්වාසයන් සමගින් බැදී ඇති සංකේතයක් ලෙස එය මුලදී ගොඩනැගිලි දොරටු අලංකාරකයක් විය.



මුල් යුගයේ නිර්මාණය වූ සඳකඩපහණ් කැටයමින් තොර වූ අතර පසු කාලීනව හෙළ කලාකරුවාගේ විස්මිත හැකියාවන් මෙම ශෛලමය නිර්මාණය හැඩකරන්නට ඇත. කෙසේ වෙතත් සඳකඩපහණ ආශ්‍රිතව සිදුකල පුරාවිද්‍යාත්මක පර්යේෂණ වලට අනුව එය බෞද්ධ පදනමක් සහිතවුත්, දාර්ශනික අගයකින් යුක්තවුත්, විශිෂ්ට නිර්මාණයක් හා ලෝක උරුමයක් ලෙස ද නම්කර ඇත.

ඉරහඳගල, අඩ්ඩපන්න පාෂාණ (අඩසඳ පහණ) පාටිකා යන නම්වලින්ද සඳකඩපහන හඳුන්වයි. සඳකඩපහණේ විකාසනය යුග තුනක් ඔස්සේ දැක්විය හැකිය, එනම් අනුරාධපුර යුගය, පොළොන්නරු යුගය හා පොළොන්නරු යුගයේ සිට මහනුවර දක්වා වූ යුගයන් වශයෙනි.

## පොළොන්නරු යුගයේ සඳකඩපහණ



අනුරාධපුර යුගයෙන් පසු එනම් පොළොන්නරු යුගය වනවිට සඳකඩපහණ නම් වූ ශෛලමය නිර්මාණයේ මූලික වෙනස් කම් කිහිපයක් සිදුවී ඇත. වැදගත්ම ලක්ෂණය වන්නේ කැටයම් බාහුල්‍යයයි. එනම් පොළොන්නරු කැටයම් කරුවා සඳකඩපහණට බොහෝ කැටයම් ආරෝපනය කර ඇත. මුල් යුගයේදී මෙන් නොව සත්ව රූප වෙන වෙනම පේළිවල නිරූපණය කර ඇත. තවද ලියකම් ද විශාල වශයෙන් වැඩි වී තිබේ. මෙම කැටයම් බාහුල්‍යය නිසා සඳකඩපහණේ පෙර තිබූ චාම්බව හා ප්‍රසන්න බව හීන වී ගොස් ඇති බව පෙනෙයි.

පොළොන්නරු සඳකඩපහණහි දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණය වන්නේ ගව රූපය ඉවත් කිරීමයි. මේ සදහා හින්දු ආගමික බලපෑම් හේතු වී ඇත. ගවයා හින්දු ආගමේ පූජනීය සත්වයෙකි, පයට පෑගීම වැලැක්වීම සඳහා ගවයා සඳකඩපහණෙන් ඉවත් කරන්නට ඇත. තවද මෙම යුගයේ ඇතැම් සඳකඩපහණ් වල සිංහ රූපයද ඉවත්කොට ඇත. ඒ වෙනුවට රටා මෝස්තර, ලියවැල් ආරෝපනය වී ඇත. මෙම යුගයේ කැටයම් කරුවා ගල් බිංදු මෝස්තරය, රටා මෝස්තරය ආදී වශයෙන් තවත් තීරු කිහිපයක් සඳකඩපහණට එකතුකර ඇත.

විශේෂත්වය වන්නේ අනුරාධපුර යුගයේ ආගමික ස්ථානවල දක්නට ලැබුනු සඳකඩපහණ පොළොන්නරු යුගයේදී බොහෝ විට රජ මාලිගා අසලද දක්නට ලැබීමයි. මෙම යුගයේ විශිෂ්ටතම සඳකඩපහණ ලෙස හදුනාගෙන ඇත්තේ පොළොන්නරු වටදාගෙය ආශ්‍රීතව ඇති සඳකඩපහණයි. මීට අමතරව පොළොන්නරු සඳකඩපහණේ දැකියහැකි තවත් සුවිශේෂී ලක්ෂණයක් වන්නේ සත්ව රූප අර්ධ උන්නත ලෙස කැටයම් කර තිබීමයි.

# පොළොන්නරු යුගයෙන් පසු මහනුවර යුගය දක්වා

පොළොන්නරු යුගය වනවිට කැටයම් බාහුල්‍යය නිසා අර්ධ කවයකට වඩා විශාල වූ සඳකඩපහණ, මහනුවර යුගය වනවිට ඊටත් වඩා වෙනස් හැඩයක් ගනී. එනම් මෙතෙක් පැවති අර්ධ වෘත්තාකාර ස්වරූපය වෙනස් වී ක්‍රමයෙන් ඉදිරියට නෙරාගිය ආකාරයක් දක්වයි. මහනුවර යුගය වනවිට සඳකඩපහණෙහි අර්ධ පත්මය සම්පූර්ණ පියුමක් ලෙස නිර්මාණය කොට ඇත. ලියකම්න් හා මල් කමින් අලංකරණය වූ නිසා සත්ව රූප ඉවත්ව ගොස් ඇත. ත්‍රිකෝණාකාර ස්වරූපයක් දක්වන මහනුවර යුගයේ හොදම සඳකඩපහණ හමුවන්නේ දළදා මාළිගයෙනි.

තවද ගංගාරාමය, මහනුවර විෂ්ණු දේවාලය, දෙගල් දෙරුව, ගඩලා දෙනිය, ලංකා තිලක, අස්ගිරි විජය සුන්දරාරාමය වැනි විහාරාරාම වලද මහනුවර යුගයට අයත් සඳකඩපහණ දක්නට ලැබේ.



## සඳකඩපහණේ නිරූපිත දාර්ශනික අගය

සඳකඩපහණ විශිෂ්ඨ කලා නිර්මාණයක් ලෙස හැඳින්වීමට හේතු වන්නේ එහි ඇති කැටයම් වලින් නිරූපණය වන භාවය හා දාර්ශනිකමය වටිනා කම නිසාවෙනි. මෙහි දාර්ශනික වටිනාකම පිළිබඳ විවිධ මත පලකල උගතුන් අතර මහාචාර්ය පරණ විතාන, මහාචාර්ය එච්. සී. පී. බෙල්, මහාචාර්ය හොකාර්ට්, මහාචාර්ය විනී විතාරණ හා සී. ටී. දේවේන්ද්‍රයන විද්වතුන් ප්‍රමුඛස්ථානයක් ගනී.

සිංහල බෞද්ධ කලා ශිල්පියාගේ කලා කෞශල්‍යය ප්‍රකට කිරීම සඳහා නිරූපිත හොඳම නිර්මාණය සඳකඩපහණ බව ඒ.එම්. හොකාර්ට් මහතාගේ ද මතයයි. තවද ඔහු පවසන පරිදි කලා නිර්මාණයක තිබිය යුතු නිර්මලත්වය හා චාම් සුන්දරත්වය සඳකඩපහණෙහි අන්තර් ගත වී ඇත.
ඇත්, අශ්ව, හංස, ගව යන සතුන් හතර දෙනාගෙන් සැඳුම්ලත් අලංකාර සත්ව පේලිය පමණක් විග්‍රහ කරණ එච්. සී. පී. බෙල් නම් වු පුරා විද්‍යාඥයා මීට වෙනස් වූ අදහසක් ප්‍රකාශ කරයි. ඔහුගේ මතයට අනුව මෙම නොනැවතී ගමන් කරණ සිවුපාවුන් හතර දෙනා මගින් සිවු දෙසින් එන භික්ෂුණ් වහන්සේලාට එකී ආරාමය විවෘතව ඇති බව ප්‍රකාශ වේ.

සඳකඩපහණ හා ඒ ආශ්‍රිත කලා නිර්මාණ වල ඇති සෞන්දර්යාත්මක බව අභිබවා, වෙනස් ආරයකින් පරීක්ෂණ පැවත් වූ මහාචාර්ය විනී විතාරණ මහතා මෙහි කැටයම් සම්බන්ධයෙන් විශේෂිත වූ අදහස් ප්‍රකාශ කරයි. ඔහුගේ මතයට අනුව සඳකඩපහණ සූර්ය හා චන්ද්‍ර යන දෙවි වරුන් දෙදෙනා හා සශ්‍රීකත්වය ඇදහීම සඳහා නිර්මාණය කරණ ලද්දකි. ඔහුට අනුව පද්මය සෞභාග්‍ය හා වාසනාව නිරූපනය කරයි, ලියවැල සියළු වෘක්ෂලතා වල ජීවය සංකේතවත් කරයි. තවද මෙහි දැක්වෙන සත්ව රූප විවිධ දෙවිවරුන්ගේ වාහන සංකේතවත් කරයි. නිදසුනක් ලෙස හංසයා බ්‍රහ්මගේ ආසනයද, ඇතා ඉන්ද්‍රගේ අසනය බවද දක්වයි.

සී. ටී. දේවේන්ද්‍ර මහතා සියළු සඳකඩපහණ් පිළිබඳ පොදු මතයක් දක්වයි. එනම්, සඳකඩපහණ යනු විහාර හා ගෙඩනැගිලි දෙරටු අලංකාර කිරීම සඳහා යොදාගත් සාර්ථක උපායක් ය යන්නයි.

මෙම සියළු විද්වත් මතවාද අභිබවමින් සමස්ථ බෞද්ධ මතයට සාපේක්ෂ වන පරිදි හරවත් හා සාධාරණ මතයක් ඉදිරිපත් කිරීමට මහාචාර්ය පරණ විතාන මහතට හැකිවිය. ලංකාවේ සියළු සඳකඩපහණ් පිළිබඳ අධ්‍යනය කිරීමෙන් පුසුව අනුරාධපුර බිසෝ මාලිගයේ සඳකඩපහණ විශිෂ්ටතම සඳකඩපහණ ලෙස එම මහතා විසින් නම් කරනු ලැබීය. ලංකාවේ පමනක් නොව දැනට ලෝකයේ ඇති වටිනාම සඳකඩපහණ ලෙසද මෙය සලකනු ලබයි. පරණ විතාන මහතා එම සඳකඩපහණ ආශ්‍රිතව තම විග්‍රහය ඉදිරිපත් කරයි'

පළා පෙති මෝස්තරය, නොනැවතී ගමන් කරන සිවුපා රූප පේලිය, විශාල ලියවැල, හංසා වලිය, කුඩා ලියවැල, අර්ධ පද්මය යනාදී වශයෙන් ප්‍රධාන කැටයම් ඔස්සේ පරණ විතාන මහතා අදහස් ඉදිරිපත් කරයි. ගිනිසිළුවන් පිටතට විහිදෙන පළා පෙති මෝස්තරයෙන් දැක්වෙන්නේ, රාග, ද්වේශ, මෝහ ගින්නෙන් සත්වයා දැවෙන බවයි. නොනැවතී ගමන් කරන ඇත්, අශ්ව, සිංහ හා ගව සත්ව රූප පේළියෙන්, ජාති, ජරා, ව්‍යාධි, මරණ, යනාදී ඉපිද ඉපදී මැරි මැරී යන භව චක්‍රය නිරූපණය කරයි. විශාල ලියවැල තන්හා ලතාවයි මෙලොව උපදින සියළු සත්වයෝ එකී තෘෂ්ණා ලතාවෙන් වෙලී බැදී පැටලී සිටින බව දක්වයි. හංසාවලිය මගින් පෙර කී තෘෂ්ණා ලතාවෙන් මිදීම සඳහා ආර්ය මාර්ගයට පිළිපන් අර්ය ශ්‍රාවකයන් නිරූපනය කරයි. කුඩා ප්‍රමාණයේ ලියවැල ආර්ය මාර්ගයේ හැසිරීම නිසා තුනී කරගෙන ඇති තෘෂ්ණාව නිරූපණය කරයි. විකසිත අර්ධ පද්මය බ්‍රහ්ම ලෝකය හෝ නිර්වාණය නිරූපණය කරයි.

| තීරුව | නෙළා ඇති කැටයම | සංකේතාත්මක අර්ථය |
|---|---|---|
| පළමු | ගිනිදැල්ල | තෘෂ්ණාව ආශාව රාග ගින්න |
| දෙවන | සත්ත්වාවලිය (ඇත්, අස්, සිංහ, ගව) | ජාති ජරා ව්‍යාධි මරන |
| තෙවන | සංකීර්ණ ලියවැල | තෘෂ්ණාවේ වෙළීම |
| සිවුවන | හංසාවලිය | සත්‍යාවබෝධය කරා යන ගමන |
| පස්වන | සරල ලියවැල් | බැඳීම්වලින් ලිහිල් වීම |
| හයවන | අඩ නෙළුම | නිවන |



## අනුරාධපුර යුගයේ සඳකඩපහණ හා එහි කැටයම් පිළිබඳව සෙනරත් පරණවිතාන ශූරීන් දක්වා ඇති අදහස



# අනුරාධපුර යුගයේ හොඳම සඳකඩපහන- අනුරාධපුර බිසෝ මාලිගය ඉදිරිපිට සඳකඩපහන



# පොළොන්නරු යුගයේ හොඳම සඳකඩපහණ-පොළොන්නරු වටදාගෙය ඉදිරිපිට සඳකඩපහන





# මහනුවර යුගයේ හොඳම සඳකඩපහණ-මහනුවර දළඳා මාලිගය ඉදිරිපිට සඳකඩපහන





## ඇගයීම

01. සඳකඩපහනක් යනු කුමක් ද?
02. අනුරාධපුර යුගයේ සඳකඩපහන හා පොළොන්නරුව යුගයේ සඳකඩපහන අතර වෙනස්කම් මොනවාද?
03. මහනුවර යුගයේ දී සඳකඩපහණේ ඇති වූ වෙනස්කම් මොනවාද?
04. අනුරාධපුර, පොළොන්නරුව, මහනුවර යන යුගවල හොඳම සඳකඩපහන් දක්නට ලැබෙන ස්ථාන මොනවාද?
05. මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා අනුරාධපුර සඳකඩපහනෙහි කැටයම් පිළිබඳව දක්වා ඇති අදහස් මොනවා ද?
06. පොළොන්නරුව යුගයේ සඳකඩපහනින් ගවයා ඉවත්වීමට බලපෑ හේතු මොනවාද?
07. සඳකඩපහන පිළිබඳව ඉදිරිපත් වී ඇති මතවාද මොනවාද?